# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/54 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 123/48(iii)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත**

(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 7, 8 සහ 11 වන වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විමසා සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2019 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2019 අංක 01 දරන වෛද්‍ය (සහතිකපත්‍ර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ නියෝගවල විධිවිධාන, පාර්ලිමේන්තුවේ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. මෙම නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම පාඨමාලා ප්‍රභේදයකට අයත් සාමාර්ථ්‍යතා සහතිකයක් හෝ ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම සඳහා කැමැත්තක් දක්වනු ලබන ඕනෑම තැනැත්තකු විසින් ලංකා වෛද්‍ය විද්‍යාල සභාව තීරණය කරන ගාස්තුවක් සහ සහතිකපත්‍ර වල සහතික කළ පිටපත් ද සමගින් මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති, අවස්ථාවෝචිත පරිදි ''අ'' ''ආ'' හෝ ''ඇ'' ආකෘතියට සාරානුකූලව, ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලේඛකාධිකාරීවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලේඛකාධිකාරීවරයා විසින් අවශ්‍ය අවස්ථාවල දී, තවදුරටත් වූ තොරතුරු ඉදිරිපත් කරන ලෙස යම් ඉල්ලුම්කරුවෙකුට නියම කරනු ලැබිය හැකි ය.

4. පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන ඇගයුම් කමිටුවක් සිටිය යුතු ය :-

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් ; එනම් -

(i) ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලේඛකාධිකාරීවරයා ;

(ii) කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ලේඛකාධිකාරීවරයා හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයා ; සහ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) අදාළ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ හැකියාව සහිත තැනැත්තන් අතරින් ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් පත් කරනු ලැබිය යුතු තිදෙනෙකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවක්,

5. 2 වන නියෝගය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලේඛකාධිකාරීවරයා විසින් එම ඉල්ලීම ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. ඇගයීම් කමිටුව විසින් ඉල්ලීමේ අන්තර්ගත කරුණු පිළිබඳව සලකා බැලීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, අදාළ ප්‍රවීණතා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාමාර්ථ්‍යතා සහතිකයක් හෝ ප්‍රවීණතා සහතිකයක් ප්‍රදානය කිරීම සඳහා ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත එම ඉල්ලීම නිර්දේශ කිරීම හෝ ඇගයීම් කමිටුව විසින් තීරණය කරනු ලබන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා එම ඉල්ලීම යොමු කිරීම හෝ තත්කාර්ය සඳහා හේතු දක්වමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය යුතු ය.

7. (1) ඉල්ලුම්කරු විසින් ලංකා වෛද්‍ය විද්‍යාල සභාවට පිළිගත හැකි අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයට නියමිත ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිළිගත් රජයේ ආයතනයක් හෝ විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් විසින් පවත්වනු ලබන උචිත පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති බවට ඇගයීම් කමිටුව විසින් සෑහීමට පත්වන අවස්ථාවක ඇගයීම් කමිටුව විසින් අදාළ ප්‍රභේදයේ කාර්යක්ෂමතා සහතිකයක් හෝ ප්‍රවීණතා සහතිකයක් ප්‍රදානය කරන ලෙස ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් ඉල්ලුම්කරුවකු විසින් III වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුරූප පාඨමාලා ප්‍රභේදය සම්බන්ධයෙන් II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති විභාග සම්පූර්ණ කර ඇති අවස්ථාවක දී හෝ උචිත විභාග සම්පූර්ණකර ඇති අවස්ථාවක දී සහ ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් අනුමත කරනු ලබන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ආයතනයකින් උචිත සුදුසුකම් ලබා ගෙන ඇති අවස්ථාවක දී, සාමාර්ථ්‍යතා සහතිකයක් හෝ ප්‍රවීණතා සහතිකයක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා එකී ආයතනයේ පුහුණු හා අධ්‍යයන තත්ත්ව සුදුසු තත්ත්වයක පවතින බව සැලකිල්ලට ගැනීමෙන් පසු ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් එම ඉල්ලුම්කරු වෙත III වන උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

## I වන උපලේඛනය

(2 වන නියෝගය)

### පාඨමාලා ප්‍රභේද

1. ඇපොතිකරි
2. ශ්‍රවණවේදී
3. පාද රෝග චිකිත්සක
4. සායනික භෞතිකවේදී
5. සායනික මනෝවේදී
6. පෝෂණවේදී
7. විද්‍යුත් ඛන්තුක රේඛනවේදී
8. විද්‍යුත් එන්සැපැලෝග්‍රාෆි රේඛනවේදී
9. වතු ඇපොතිකරි
10. වෛද්‍ය රසායනාගාර ශිල්පී
11. පවුල් සෞඛ්‍ය සේවා
12. පෝෂණවේදී
13. වෘත්තීය චිකිත්සක
14. අක්ෂි සහායක
15. ඖෂධවේදී
16. භෞත චිකිත්සක
17. විකිරණවේදී
18. කථනවේදී

### සාමාර්ථ්‍යතා සහතිකය

1. ඇපොතිකරි
2. වතු ඇපොතිකරි
3. පවුල් සෞඛ්‍ය සේවා
4. ඖෂධවේදී

### ප්‍රවීණතා සහතිකය

1. ශ්‍රවණවේදී
2. පාද රෝග චිකිත්සක
3. සායනික භෞතවේදී
4. සායනික මනෝවේදී
5. පෝෂණවේදී
6. විද්‍යුත් ඛන්තුක රේඛනවේදී
7. විද්‍යුත් එන්සැපැලෝග්‍රාෆි රේඛනවේදී
8. වෛද්‍ය රසායනාගාර ශිල්පී
9. පෝෂණවේදී
10. වෘත්තීය චිකිත්සක
11. ඖෂධවේදී
12. භෞත චිකිත්සක
13. විකිරණවේදී
14. කථනවේදී

සාමාර්ථ්‍යයතා ඩිප්ලෝමාව

අපොතිකරි

**II වන උපලේඛනය**

(2 වන නියෝගය)

"අ" ආකෘති පත්‍රය

ලංකා වෛද්‍ය විද්‍යාල සභාව

............................. වශයෙන් සාමාර්ථ්‍යයතා සහතිකයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම

1. වාසගම (පැහැදිලි අකුරින්) : ....................................................................................
2. වෙනත් නම් (පැහැදිලි අකුරින්) : ....................................................................................
3. ලිපිනය (පැහැදිලි අකුරින්) : ....................................................................................
4. දුරකථන අංකය : ............................................. විද්‍යුත් ලිපිනය : .......................................................
5. උපන් දිනය : ....................................................................................
6. ස්ත්‍රී / පුරුෂ භාවය : ....................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය හා දිනය : ....................................................................................
8. සාමාර්ථ්‍යයතා සහතිකය සඳහා වූ ඉල්ලීම : (කරුණාකර උචිත කොටුවේ හරි ලකුණ යොදන්න)

| | |
|---|---|
| ☐ | 1. ඇපොතිකරි |
| ☐ | 2. වතු ඇපොතිකරි |
| ☐ | 3. පවුල් සෞඛ්‍ය සේවක |
| ☐ | 4. ඖෂධවේදී |

9. පුහුණු ආයතනය : ....................................................................................
10. ප්‍රධාන රට : ....................................................................................
11. පුහුණු කාලසීමාව : ....................................................................................
12. සමත් වූ අවසන් විභාගය : ....................................................................................

    (අ) විභාගයේ ස්වභාවය : ....................................................................................
    (ආ) ආයතනය සහ මධ්‍යස්ථානය : ....................................................................................
    (ඇ) මාසය සහ අවුරුද්ද : ....................................................................................

13. වර්තමාන රැකියාව : ....................................................................................
14. දරන ලද තනතුර (දිනය සමග) තනතුර .................... ...................... සිට ............................. දක්වා
15. වෙනත් යම් අදාළ විස්තර : ....................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මම ප්‍රකාශකර සිටිමි.

.........................................

ඉල්ලුම්කරුගේ අත්සන

සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :-
දිනය :-

සාක්ෂි

අත්සන :-
නම :-
ලිපිනය :-
දිනය :-

සැලකිය යුතුයි :- කරුණාකර මෙම ඉල්ලුම්පත්‍රය සමග මුල් ලේඛනවල පිටපත් පමණක් ඉදිරිපත් කරන්න ፡ මුල් පිටපත් එවීමෙන් වැලකී සිටින්න.

"ආ" ආකෘතිය

*ලංකා වෛද්‍ය විද්‍යාල සභාව*

................................. වශයෙන් ප්‍රවීණතා සහතික පත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම

1. වාසගම (පැහැදිලි අකුරින්) : ....................................................................................
2. වෙනත් නම් (පැහැදිලි අකුරින්) : ....................................................................................
3. ලිපිනය (පැහැදිලි අකුරින්) : ....................................................................................
4. දුරකථන අංකය : .............................. විද්‍යුත් ලිපිනය : .....................................................
5. උපන් දිනය : ....................................................................................
6. ස්ත්‍රී/පුරුෂ භාවය : ....................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය හා දිනය : ....................................................................................
8. ..................................................... වශයෙන් ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම

| | | | |
|---|---|---|---|
| ☐ | 1. ශ්‍රවණවේදී | ☐ | 9. පෝෂණවේදී |
| ☐ | 2. පාද රෝග චිකිත්සක | ☐ | 10. වෘත්තීය චිකිත්සක |
| ☐ | 3. සායනික භෞතවේදී | ☐ | 11. ඖෂධවේදී |
| ☐ | 4. සායනික මනෝවේදී | ☐ | 12. භෞත චිකිත්සක |
| ☐ | 5. පෝෂණවේදී | ☐ | 13. විකිරණවේදී |
| ☐ | 6. විද්‍යුත් ඛන්තුක රේඛනවේදී | ☐ | 14. කථනවේදී |
| ☐ | 7. විද්‍යුත් එන්සැපැලෝග්‍රාෆි රේඛනවේදී | ☐ | |
| ☐ | 8. වෛද්‍ය රසායනාගාර ශිල්පී | ☐ | |

9. පුහුණු ආයතනය : ....................................................................................
10. පුහුණු කාලසීමාව : ....................................................................................
11. සමත් වූ අවසන් විභාගය : ....................................................................................

(අ) විභාගයේ ස්වභාවය : ....................................................................................

(ආ) ආයතනය සහ මධ්‍යස්ථානය : ....................................................................................

(ඇ) මාසය සහ අවුරුද්ද : ....................................................................................

12. වර්තමාන රැකියාව : ....................................................................................

13. දරන ලද තනතුර (දිනය සමග) තනතුර ...................................... සිට ........................................... දක්වා

14. වෙනත් යම් අදාළ විස්තර : ....................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මම ප්‍රකාශකර සිටිමි.

................................
ඉල්ලුම්කරුගේ අත්සන

සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :-

දිනය :-

සාක්ෂි

අත්සන :-

නම :-

ලිපිනය :-

දිනය :-

සැලකිය යුතුයි :- කරුණාකර මෙම ඉල්ලුම්පත්‍රය සමග මුල් ලේඛනවල පිටපත් පමණක් ඉදිරිපත් කරන්න : මුල් පිටපත් එවීමෙන් වැලකී සිටින්න.

"ඇ" ආකෘති පත්‍රය

ලංකා වෛද්‍ය විද්‍යාල සභාව

........................... වශයෙන් සාමාර්ථ්‍යයතා ඩිප්ලෝමා සහතිකයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම

1. වාසගම (පැහැදිලි අකුරින්) : ....................................................................................

2. වෙනත් නම් (පැහැදිලි අකුරින්) : ....................................................................................

3. ලිපිනය (පැහැදිලි අකුරින්) : ....................................................................................

4. දුරකථන අංකය : ...................................... විද්‍යුත් ලිපිනය : ..............................................

5. උපන් දිනය : .....................................................................................
6. ස්ත්‍රී / පුරුෂ භාවය : .....................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය හා දිනය : .....................................................................................
8. ......................................... වශයෙන් සාමාර්ථ්‍යයතා ඩිප්ලෝමා සහතිකයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම

☐ අතුරු වෛද්‍ය

9. පුහුණු ආයතනය : .....................................................................................
10. පුහුණු කාලසීමාව : .....................................................................................
11. සමත් වූ අවසන් විභාගය : .....................................................................................

(අ) විභාගයේ ස්වභාවය : .....................................................................................

(ආ) ආයතනය සහ මධ්‍යස්ථානය : .....................................................................................

(ඇ) මාසය සහ අවුරුද්ද : .....................................................................................

12. වර්තමාන රැකියාව : .....................................................................................
13. දරන ලද තනතුර (දිනය සමග) තනතුර .................................................... සිට ........................................ දක්වා
15. වෙනත් යම් අදාළ විස්තර : .....................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මම ප්‍රකාශකර සිටිමි.

...............................

ඉල්ලුම්කරුගේ අත්සන

සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :-

දිනය :-

සාක්ෂි

අත්සන :-

නම :-

ලිපිනය :-

දිනය :-

සැලකිය යුතුයි :- කරුණාකර මෙම ඉල්ලුම්පත්‍රය සමග මුල් ලේඛනවල පිටපත් පමණක් ඉදිරිපත් කරන්න : මුල් පිටපත් එවීමෙන් වැලකී සිටින්න.

**III වන උපලේඛනය**

(7 වන නියෝගය)

| | I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|---|
| අංකය | විෂය ප්‍රභේදය | විභාගය | සහතික පත්‍රවල ස්වභාවය |
| 1. | ඇපොතිකරි | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | සාමාර්ථ්‍යයතා සහතිකය හෝ සාමාර්ථ්‍යයතා ඩිප්ලෝමාව |
| 2. | ශ්‍රවණවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 3. | පාද රෝග චිකිත්සක | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 4. | සායනික භෞතවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 5. | සායනික මනෝවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 6. | පෝෂණවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 7. | විද්‍යුත් ඛන්තුක රේඛනවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 8. | විද්‍යුත් එන්සැපැලෝග්‍රැෆි රේඛනවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 9. | වතු ඇපොතිකරි | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | සාමාර්ථ්‍යයතා සහතිකය |

**III** වන උපලේඛනය (සම්බන්ධිතයි)

(7 වන නියෝගය)

| | *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|---|
| *අංකය* | *විෂය ප්‍රභේදය* | *විභාගය* | *සහතික පත්‍රවල ස්වභාවය* |
| 10. | වෛද්‍ය රසායනාගාර ශිල්පී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 11. | පවුල් සෞඛ්‍ය සේවා | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | සාමාර්ථ්‍යයතා සහතිකය |
| 12. | පෝෂණවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 13. | වෘත්තීය චිකිත්සක | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 14. | අක්ෂි සහායක | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 15. | ඖෂධවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | සාමාර්ථ්‍යයතා සහතිකය හෝ ප්‍රවීණතා සහතිකය |
| 16. | භෞතික චිකිත්සක | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 17. | විකිරණවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |
| 18. | කථනවේදී | ලංකා වෛද්‍ය විද්‍යාල සභාව වෙත පිළිගතහැකි ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක්. | ප්‍රවීණතා සහතිකය |

03- 210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.